# "ආරූඪය" පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

එම්. ධනුෂ්ක කුමාර ආරියවංශ[1]

මිනිස් ශරීරයෙන් මනෝකාය ඉවතට ගැනීම සහ අදෘශ්‍යමාන මනෝකායයක් මිනිස් ශරීරයට ප්‍රවිෂ්ටවීම ආරූඪවීමයි. මේ පිළිබඳ බටහිර ලෝකයේ මූලික කතිකාවත පයිතග රස්, සොක්‍රටීස්, ඇරිස්ටෝට්ල්, සිසරෝ යන දාර්ශනිකයන් විසින් සිදුකර ඇත. ඔවුන්ට අනුව මිනිසාට මනෝකායක් ඇත. මරණින් මතු එය පැවතුණි. ඔhe miracle on the Wall (බිත්තියේ පුදුමය) නම් කෘතියේදී "පොටින්" සඳහන් කරන ආකාරයට ග්‍රීසියේ ඇපලෝ දෙව්මැදුරේ පූජකවරියක් දිව්‍යමය වරප්‍රසාදයෙන් ආරූඪ වී  ප්‍රශ්න විසඳූ ආකාරය ගැන ඇති සඳහන මේ පිළිබඳ ඇති මුල් වාර්තාවලින් එකකි. එම කෘතියම සඳහන් කරන ආකාරයට කොන්ස්ටයින්ටයින් අධිරාජ්‍යයා රෝමයේ රාජ්‍ය ආගම බවට කතෝලික දහම නම් කළ පසු කතෝලික නිකායික සභාව මගින් ක්‍රි.ව. 325 දී එතෙක් සාම්ප්‍රදායිකව පැවති ආරූඪ වූ කපුවන් සහ රෝග සුවකරන්නන් මාර්ගයෙන් මරණයට පත්වූවන් සමග තොරතුරු සන්නිවේදනය කිරීම තහනම් කර ඇත. නමුත් 18 වන සියවසේදී ජීවිතය දෙස භෞතිකව පමණක් බැලීම ට විරුද්ධ වූ වෙනත් ලෝකයක් පිළිබඳ විශ්වාස කළ ඇමරිකානු ජාතික ප්‍රභූන් පිරිසක් ගුප්ත සිද්ධි ගැන අධ්‍යයනයට විද්‍යාත්මක කමිටුවක් ඇතිකළ යුතුබවට පෙත්සමක් සෙනෙට් සභාවට යොමුකර 1852 දී අනුමත කරගෙන ඇත. 1856 දී මේ පිළිබඳ පර්යේෂණ වාර්තාවක් රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය රොබට් ගෙයා විසින් ඉදිරිපත් කර ඇත. එංගලන්තයේ සර් විලියම් කෲක් හා සර් විලියම් බැරට්, ඉතාලියේ සිසර් ලොම්බ්‍රොසෝ ආදීන් පරලොව සහ මෙලාවෙ අතර සන්නිවේදනය ආවේශ වූ කපුමහතුන් මගින් කළ හැකි බවට පිළිගැනීම නිසා මෙය යුරෝපය පුරා ව්‍යාප්ත වූ සංකල්පයක් බවට පත්ව ඇත. ආරූඪ වීම ප්‍රමුඛ ව යොදාගනු ලබන්නේ නෙපෙනෙන ලෝකයේ සිටින්නෙකුගේ තොරතුරු දැන ගැනීමට  ය. එහිදී මියගිය අය හා ඥාතීන් අතර යම් ප්‍රවාහකයෙකු හරහා තෙරතුරු සන්නිවේදනය කරනු ලබයි. එහදී කපුවාට අධි මානසික ශක්තියක් හෝ අවබෝධයක් දැනෙන අතර මෙම සංකල්පය පෙරදිග සංස්කෘතියේදී ඉතා දීර්ඝ කාලයක සිට භාවිතයට ගෙන ඇත. මේ පිළිබඳ මනෝවිද්‍යාත්මකව අධ්‍යයනය කර එය විශ්ලේෂණය කිරීම මෙහි ප්‍රමුක අරමුන වේ.

**ප්‍රමුඛ පද :** ආරූඪ, දේවාත්මය, මනෝකාය, ප්‍රවාහකයා, පාලන ශක්තිය

1 තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ariyawanshadanushka@gmail.com